ලිංගික අපරාධයක් හෝ ලිංගික අපයෝජනයක් හැඳින්වීමට බහුලව මාධ්‍ය තුළ භාවිතා වන "දූෂණය" නැතිනම් "කෙළෙසීම" යන යෙදුම්, කෙතරම් දුරට යෝග්‍ය වන්නේ ද යන ගැටළුව, Ethics Eye ඔස්සේ බොහෝ විට අප පාඨක අවධානයට යොමු කොට ඇත.

දූෂණය හෝ කෙළෙසීම යන යෙදුම් වල ඇති ගැටළුව වන්නේ, ලිංගික අපරාධයකට හෝ ලිංගික අපයෝජනයකට මුහුණ පෑ අය අපවිත්‍ර වී ඇති බවක්, කිලිටි වී ඇති බවක් ඒ ඔස්සේ ගම්‍ය වීමයි. එය ගර්හාත්මක සමාජ ආකල්පයකට ඉඩ පෑදිය හැකි අතර, ඒ ඔස්සේ ලිංගික අපරාධයකට හෝ ලිංගික අපයෝජනයකට මුහුණ පෑ අය කොන් කිරීමකට ලක්වීමේ ඉඩක් ද තිබේ.

1) ඔබ සිතනා ලෙසට, "දූෂණය", "කෙළෙසීම" වැනි යෙදුම් වෙනුවට, ලිංගික අපරාධය හෝ ලිංගික අපයෝජනය වැනි යෙදුමක් භාවිතා කිරීම වඩාත් උචිත යැයි ඔබ නොසිතන්නේද?

2) එසේත් නැතිනම්, "දූෂණය", "කෙළෙසීම" වැනි යෙදුම් වෙනුවට යොදා ගත හැකි වඩාත් යෝග්‍ය යෙදුම් ඔබට යෝජනා කළ හැකිද?

(ජනවාරි 17, 2022 හිරු ප්‍රධාන පුවත් විකාශය, ජනවාරි 17, 2022 මව්බිම සහ අරුණ, ජනවාරි 18, 2022 ලංකාදීප ඇසුරිණි.)